# පූස් යාලුවෝ.



රුනිති අකිත්මා බණ්ඩාර.

# පූස් යාලුවෝ.

රුනිති අකිත්මා බණ්ඩාර.

කතෘ අයිතිය ISBN 978-624-208-559-3

පාසල- මහාමායා බාලිකා විදුහල මහනුවර.

පංතිය 2-E

කෘතිය පළ කරන දිනය 2025.02.08

වෙනත් කෘති - බඩගිනි තාරාවා

පිදුම.

පුරා වසර දෙකක් මා හට අකුරු ඉගැන්වූ ආදරණීය
දිල්රුක්ෂි ඊෂ්වරගේ ගුරුමැණියන්ට ආදරයෙන්.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවධර්නය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණියුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වණර්මය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.මෙම ශාස්ති්‍රය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

කිටී කියන්නේ අපේ ගෙදරට අලුතෙන් ආපු පූස් අම්මා කෙනෙක්.මෙයාට ටිකක් ලොකු බඩක් තිබුණා. අපේ අම්මා කියපු විදිහට මේ කිටී අම්මාට පැටව් හම්බෙන්න වගේ.

මේ කිටී අම්මා හැමදාම උදේට අපේ ගෙදරට එන්න පුරුදු වෙලා හිටියා. හැමදාම උදේට අපේ අම්මා මේ කිටී අම්මාට කිරි එකක් දෙන්න පුරුදු වෙලා හිටියා.



ඔන්න ටික දවසක් ගියා. මේ කිටී අම්මා ලස්සන බබාලා හතර දෙනෙක් දාලා කියලා අපේ අම්මා අපිට කිව්වා.නංගීයි මල්ලීයි මමයි හරි ආසාවෙන් මේ බබාලා බලන්න හිටියා.

මේ දවස් වල හරියට වහින්න ගත්තා. පූස් අම්මා බබාලා අරං අපේ වහල යටට ගිහිල්ලා හිටියා.



එක දවසක් අපේ ගෙදර ඇතුලේ ඉඳලා මේ කිටී අම්මා එළියට දුවගෙන ගියා.අපි ගිහිල්ලා බලන කොට මේ පූස් අම්මා එයාගේ ලස්සන බබාලා දෙන්නත් අරගෙන ඇතුළට ඇවිල්ලා පෙට්ටියක් ඇතුලේ හරි රස්නෙට තියලා.



හරිම ලස්සන දවසක මේ කිටී අම්මාගේ බබාලා දෙන්නා ලස්සනට ඇස් ඇරලා හිටියා. අපි මේ පුංචි බෝල ගෙඩි දෙකට වයිටී සහ ඇෂී කියලා නම දැම්මා. මේ වයිටී සුදු පාටයි දුඹුරු පාටයි. අපි මේ පුංචි බෝල ගෙඩි දෙක ඉක්මනට ලොකු වෙලා අපිත් එක්ක සෙල්ලම් කරන්න එනකං ආසාවෙන් බලාගෙන හිටියා.




එක දවසක් උදේ මේ බබාලා දෙන්නා හයියෙන් අඬනවා ඇහුණා.අපි හැමෝම ගිහිල්ලා බැලුවා.මේ බබාලාගේ අම්මා එතන හිටියේ නෑ.අපි හැමතැනම අම්මාව හෙව්වා.

දවස් දෙකක් බැලුවා මේ අම්මා ආවේ නෑ.ආයේ ටිකක් බලන කොට කිටී අම්මා මැරිලා හිටියා. නංගීයි මමයි වයිටී පැටියයි ඈෂී පැටියයි ආයෙත් ගෙදර එක්කගෙන ආවා.අපි හරිම ආදරෙන් බබාලා දෙන්නාට කිරි දුන්නා.



ටික දවසක් පූස් බබාලා එක්ක අපි හරිම සතුටින් දවස ගත කරා.අපි ඉස්කෝලේ ගිහිල්ලා ආපු ගමන් කරන්නේ පූස් බබාලා එක්ක සෙල්ලම් කරන එකයි.එයාලා අපේ කකුල් වල දැවටි දැවටී අපේ පිටිපස්සෙන් එන්න ගත්තා.



එක දවසක් උදේ අපි කූඩුව ළඟට ගියා.වෙනදා වගේ වයිට් පැටියෙක් හිටපු පෙට්ටියෙන් එළියට ආවේ නෑ. ඇඹී විතරක් කිරි බොන්න ආවා.අපි අම්මාට කිව්වා.අම්මා ඇවිත් බැලුවා වයිටී ට මොකද වෙලා තියෙන්නේ කියලා.බලන කොට වයිටී අසනීප වෙලා.



එදා උදේම අම්මා වයිටීව අරගෙන ගියා බෙහෙත් ගන්න. වයිටී ට අමාරුයි කියලා අම්මා එක්ක ඒ දොස්තර මාමා කියලා තිබ්බා.එදා හවස වයිටී අපිව දාලා ගියා කියලා අපිට කිව්වා.අපි හරිම දුකින් එදා ගෙදර ආවා.ඇවිල්ලා එයාගේ අම්මා ළඟින්ම එයාවත් තිබ්බා.



තව දවසක් බලන කොට ඇෂී ත් අපිව දාලා ගිහිල්ලා තිබ්බා.අන්තිමට පූස් බබාලා දෙන්නා එයාලාගේ අම්මාව හොයාගෙන ගිහිල්ලා තිබ්බා.නංගී යි මල්ලී යි මමයි හරි දුකින් බලාගෙන හිටියා.





# පසුවදන

රටේ අනාගත සංවධර්නයට ඉවහල් වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිමර්ණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාථර් ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව කියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන කි්‍රයාමූලික පයෙර්ෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා කි්‍රයාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය. මුද්‍රිත පොත තවමත්අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි.පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය.මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනථර්කාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලූ ප්‍රශ්න නිමර්ාණය වීමට හේතු වී ඇති බව පයෙර්ෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් කි්‍රයාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාටර් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිමර්ාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල්ෙවිදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිමර්ාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිමර්ාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්